**e-රාජ්‍ය ප්‍රතිපත්තිය ශ්‍රී ලංකාවේ ප්‍රාදේශිය ලේකම් කාර්යාල තුළ කෙතෙක් දුරට ක්‍රියාත්මකවේද යන්න පිළිබද විමර්ශනාත්මක අධ්‍යයනක් (ගම්පහ ප්‍රාදේශිය ලේකම් කොට්ටාශය ඇසුරින් )**

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

***සඳමාලි .පී.ඒ [1]***

***වත්මානෙල් සෙනෙවිරත්න[2]***

**සංක්ෂේපය**

රාජ්‍ය අංශයේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිත කිරිම පිණිස වර්තමානය වන විට ප්‍රතිපත්ති ක්‍රියා පටිපාටි සලසයි. මෙම පර්යේෂණය තුළින් ඉ-.රාජ්‍ය සංකල්පය ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ කෙතෙක් දුරට ඉටුවනවා ද යන්න පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම සිදු කරන අතර එය ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල ඇසුරින් සිදුවිය. ඉ-රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කිරීම තුළ පරිගණක හා තොරතුරු තාක්ෂණ පද්ධති සහ නවීන තාක්ෂණය භාවිත කරන ආකාරය, පුහුණුව ලත් කාර්ය මණ්ඩලයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල තුළ අනුයුක්ත කර තිබේද හා සේවා ලාභින් හා සේවා දායකයින් මුහුණ දෙන ගැටලු පිළිබඳවත් මෙම අධ්‍යයනයෙන් තුළින් විමර්ශනය කර ඇත.

මෙම පර්යේෂණයෙහි දත්ත රැස් කිරීම සඳහා ප්‍රශ්නාවලි ක්‍රමය මෙන් ම සම්මුඛ සාකච්ඡා ක්‍රමය උපයෝගි කරගනු ලැබීය. මෙහි දී සංගහනය වනුයේ පරිපාලන ඒකකයක් වන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන්ය. ගම්පහ දිස්ත්‍රික්කය තුළ කැලණිය, මහර, ජා-ඇල , වත්තල හා ගම්පහ යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මේ සඳහා යොදා ගනු ලැබු අතර එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකින් සේවා ලබා ගැනීමට පැමිණෙන සේවාලාභීන් 20ක පමණ පිරිසක් තුළින් අරමුණුවලට ගැළපෙන පරිදි සකස් කරගනු ලැබු ප්‍රශ්නාවලි 100ක් ඔස්සේ දත්ත ඒකරාශී කරනු ලැබීය. මීට අමතරව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයන් හි සේවා දායකයින් සීමිත පිරිසක් උපයෝගී කොට ගනිමින් ඉලක්කගත සම්මුඛ සාකච්ඡාවක් සිදු කිරීමෙන් හරහා දත්ත ඒකරාශී කරගනු ලැබීය. ඉ-රාජ්‍ය සංකල්පය බිහි වී වසර ගණනාවක් ගත වුව ද එය සාර්ථක අන්දමින් ක්‍රියාත්මක නොවන බව මෙම අධ්‍යයනයෙන් නිගමනය කළ හැකි විය. මෙම සංකල්පය පිළිබඳ ඇති නොදැනුවත්භාවය ද, නවීන තාක්ෂණය භාවිත කිරීමට ඇති නොහැකියාව හේතුවෙන් සේවා තොරතුරු ලබා ගැනීමට ඇති නොහැකියාව ප්‍රධාන ලෙසම සේවාලාභීන්ගේ පාර්ශවයෙන් හඳුනාගත හැකි වුව ද සේවාදායකයන්ට නවීන තාක්ෂණය භාවිත කිරීමේ දී ගැටලු මතු වීම, පුහුණු වැඩසටහන් ආදිය ක්‍රියාත්මක නොවීම මත ඔවුන් සතු දැනුම යාවත් කාලීන නොවීම යන කරුණු මූලිකවම හඳුනාගත හැකි වූ අතර මේ හේතුවෙන් ඉ-.රාජ්‍ය සංකල්පය අරමුණු විධිමත් ලෙස ඉටු නොවන බව නිගමනය කළ හැකිය. ඉ-රාජ්‍ය සංකල්පය ඔස්සේ සේවය ලබාදීම විධිමත් හා ක්‍රමවත් සැලැස්මක් අනුව සිදු කළ යුතු අතර ආයතනය පිළිබඳ වගකීම් දරන්නන්ට ප්‍රයෝගිකව උනන්දුව ඇති කිරීම ද අභ්‍යන්තර සේවකයින් එම කාර්යයට යොදවා ගැනීම ද ප්‍රයෝගිකව කළ යුතු බව යෝජනා ලෙස ඉදිරිපත් කළ හැකිය.

*1. පුස්තකාල විද්‍යාව, පුස්තකාල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*

*2. ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, පුස්තකාල විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව*